# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/26 - 2022 සැප්තැම්බර් මස 12 වැනි සඳුදා - 2022.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : බීඩී/ඊඑල්එල්/එල්එන්ඩී/3/ඒකිවියුඑස්එන්/32.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/10/2019/එම්වී/394.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 69බී හීල්ඔය ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, උඩුකුඹල්වෙල ගමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අ.ග.පි. 27 අතිරේක 117, පත්‍ර 116 හා 2022.01.25 වැනි දින දරන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 1570 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.7344ක් පමණ වන "ගල්හින්නේ පතන" නමැති ඉඩම් කැබැල්ල (කැබලි 01):

01. **කැබලි අංක 1570**
ඉඩමේ නම: ගල්හින්නේ පතන; ප්‍රමාණය: හෙක්ටයාර් 4.7344.

මායිම් : - *උතුරට* : කැබලි අංක 13සීවයි; *නැගෙනහිරට* : කැබලි අංක 13සීවයි, 1571, 580, 579, 577, 576, 574, 566 සහ 1572; *දකුණට*: කැබලි අංක 13සීවයි, 1571, 580, 579, 577, 576, 574, 566 සහ 1572 සහ 1573 (හි.පි.385700); *බටහිරට* : කැබලි අංක 1573 (හි.පි.385700) සහ 13සීවයි.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2022 නොවැම්බර් මස 23 වැනි දින පෙරවරු 10.00ට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 නොවැම්බර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඉන්දික ගයාන් පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

2022 සැප්තැම්බර් මස 07 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

EOG 09 - 011